***ගොහාගොඩ අවසන් බැහැරලීම් අංගනයේ කසළ කලමනාකරණය සඳහා සංවර්ධන යෝජනා කැඳවීම. (EOI)***

**සංවර්ධනය සහ පාලන යෝජනාව - ගොහාගොඩ අවසන් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය(මහනුවර මහ නගර සභාව සතුය).**

**ගොහාගොඩ අවසන් ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ස්ථානය සංවර්ධනය කිරීම,පාලනය කිරීම සහ තිරසාර කළමනාකරණය සඳහා සුදුසුකම් ලත් සහ උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් මහනුවර මහ නගර සභාව (Kandy Municipal Council)අදහස් හා යෝජනා (EOI) කැඳවීම.**
**එම යෝජනා පරිසර හිතකාමී සහ සෞඛ්‍යයට හිතකර අපද්‍රව්‍ය කළමනාකරණ විසඳුමක් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර යෝජිත ව්‍යාපෘතියේ වාසි සහ එහි ප්‍රතිඵල පැහැදිලි ලෙස පෙන්නුම් කළ යුතුය.**

***වත්මන් තත්ත්වය***

- **මුළු භූමි ප්‍රමාණය: අක්කර 30 (යෝජිත ව්‍යාපෘතිය සඳහා ආසන්න වශයෙන් අක්කර 3 සිට 5 දක්වා)**
- **දෛනික අපද්‍රව්‍ය එකතු කිරීම: මෙට්‍රික් ටොන් 80–100.**
- **අපද්‍රව්‍ය සංයුතිය: කාබනික අපද්‍රව්‍ය වලින් 70% ක් සහ කාබනික නොවන අපද්‍රව්‍ය වලින් 30% ක් පමණ.**
- **දැනට අවුරුදු 50 කට වැඩි කාලයක් කසළ බැහැර කල අංගන 03 ක් ඇති අතර එහි ඇති කසළ ව්‍යාපෘතියට ලබා ගැනීමට හැකිය.**
- **එමෙන්ම නගර සිමාවේ වැසිකිළි අපජල පිරිපහදු පද්ධතියෙන් දිනකට මිටර්කියුබ් 5 ක ප්‍රමාණයක වැසිකිලි අපද්‍රව්‍ය ඉවත් කිරීම සිදු කරනු ලබන අතර එය වෙනත් ව්‍යාපෘතීන් සඳහා යොමු කිරීමට හැකියාව පවතී.**
- **උපයෝගිතා: භූමියේ දැනට තෙකලා විදුලි සම්බන්ධතාවයක් සහ ජාතික ජල මණ්ඩලයෙන් ජල සැපයුමක් ඇත. අමතර ස්වාභාවික ජල සම්පත් අසල ඇති මහවැලි ගඟෙන් ලබා ගත හැකිය.**

***අරමුණ***

**මහනුවර මහ නගර සභාවේ අරමුණ වන්නේ ගොහාගොඩ අවසන් කසළ බැහැර කිරීමේ ස්ථානය වැඩිදියුණු කිරීම, පාලනය කිරීම සහ දිගුකාලීන කළමනාකරණය සඳහා තිරසාර,පාරිසරික වශයෙන් වගකිවයුතු සහ ආර්ථික වශයෙන් ශක්‍යතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීමයි. සංවර්ධනය සියලුම අදාළ රජයේ නීති සහ රෙගුලාසි වලට අනුකූල විය යුතුය.**

***යෝජනා සඳහා ආරාධනාව:***

**යෝජනා පහත සඳහන් අංශ ඇතුළත් කිරීමට අවශ්‍ය වේ.**

**1. ස්ථාන පාලනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා තාක්ෂණික ප්‍රවේශය.**

**2. පාරිසරික ආරක්ෂණ පියවර.**

**3. මූල්‍ය හා මෙහෙයුම් ශක්‍යතාව.**

**4. නීතිමය සහ ක්‍රියා පටිපාටිමය සලකා බැලීම්.**

**5. ශ්‍රී ලාංකික සහ විදේශීය ආයෝජකයින් සඳහා ආයෝජන අවස්ථා (විදේශීය ආයෝජකයින් ලියාපදිංචි දේශීය අනුබද්ධිත ආයතනයක් හරහා ක්‍රියාත්මක විය යුතුය).**

***<u>නියමයන් සහ කොන්දේසි</u>***

**• ඉදිරිපත් කරන ලද සියලුම යෝජනා මහනුවර මහා නගර සභාව විසින් පත් කරන ලද විශේෂිත තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් සමාලෝචනය කර ඇගයීමට ලක් කරනු ලැබේ.**

***<u>• යෝජනාවලට ඇතුළත් විය යුත්තේ:</u>***

**1. ව්‍යාපෘති කාලසීමාව සහ ක්‍රියාත්මක කිරීමේ කාලසටහන**

**2. භාරදීමේ ක්‍රියාවලිය සහ මෙහෙයුම් සැලැස්ම**

**3. රජයට සහ KMC වෙත ප්‍රතිලාභ සහ අගය එකතු කිරීම්**

සියලුම යෝජනා ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර එම යෝජනා ලියාපදිංචි තැපැලෙන්, කුරියර් මගින් හෝ පහත දක්වා ඇති ලිපිනයට පෞද්ගලිකව ඉදිරිපත් කළ හැකිය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "***<u>ගොහාගොඩ අවසන් බැහැරලීම් අංගනයේ කසළ කලමනාකරණය සඳහා සංවර්ධන යෝජනා කැඳවීම</u>***" *යනුවෙන් සදහන්* කළ යුතුය.

**නාගරික කොමසාරිස්**
**මහ නගර සභාව**
**මහනුවර.**

සණ අපද්‍රව්‍ය කළමනාකරණ අංශය - 0812-229936
සැපයුම් අංශය - 0812-232071

***<u>යෝජනා කැඳවීමේ අවසන් දිනය :</u>*** **<u>2026.01.09 - 10.00 AM</u>**

**වැඩිදුර තොරතුරු හෝ වත්මන් ස්ථාන තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා,උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට කාර්යාල වේලාවන් තුළ මහනුවර මහා නගර සභාවේ සන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය හෝ සැපයුම් අංශය අමතන්න.**